මිනිසා මිය ගිය විටෙක, කරුණු තුනක් හැර ඔහුගේ සෙසු ක්රියාවන් ඔහුගෙන් විසන්ධි වී යනු ඇත. එනම්, සදාතනිකභාවයක් ඇති දානය, ප්රයෝජනය ලබන දැනුම, ඔහු වෙනුවෙන් ප්රාර්ථනා කරන දැහැමි දරුවා

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "මිනිසා මිය ගිය
විටෙක, කරුණු තුනක් හැර ඔහුගේ සෙසු ක්රියාවන් ඔහුගෙන් විසන්ධි වී යනු ඇත. එනම්, සදාතනිකභාවයක් ඇති දානය, ප්රයෝජනය ලබන දැනුම, ඔහු වෙනුවෙන් ප්රාර්ථනා කරන දැහැමි දරුවා."
[صحيح] [رواه مسلم]

සැබැවින්ම මියගිය තැනැත්තාගේ ක්රියාවන් ඔහු මිය යෑමත් සමග විසන්ධි වී යනු ඇත. ඔහුගේ මරණයෙන් පසු මෙම කරුණු තුන තුළ දී හැර වෙනත් කිසිදු යහපතක් ඔහු ලබන්නේ නැත. ඔහුට ඒ සඳහා හේතු වනුයේ: පළමුව: පුණ්යභාරය, මස්ජිද් ඉදි කිරීම, පොදු ලිං තනා දීම වැනි ප්රතිඵල ගලා යන, විසන්ධි නොවන, සමාජයට සදහටම පවතින දානයයි. දෙවැන්න: දැනුමෙන් සපිරුණු පොත් පත් නිර්මාණය කිරීම, පුද්ගලයකුට ඉගැන්වීම වැනි සෙසු මිනිසුන් ප්රයෝජනය ලබන දැනුමයි. එය ඔහුගේ මරණයෙන් පසු එය පැතිර යාමෙන් අදාළ තැනැත්තා එය ක්රියාත්මක කිරීමට පෙළඹෙන බැවිනි. තුන්වැන්න: තම දෙමාපියන්ට ප්රාර්ථනා කරන දේවත්වය විශ්වාස කරන දැහැමි දරුවා.

https://sunnah.global/hadeeth/si/show/65566